අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/1/3/2 - i

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.03. 12

**චක්‍රලේඛ අංකය: 15 /2025**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කොට්ඨාස භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම පරිවෙණාධිපති හිමිවරුන්

සියලු ම විදුහල්පතිවරුන් වෙත

**සමස්ත ලංකා පාසල් සංගීත තරගය (සිංහල මාධ්‍ය) - 2025**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් වාර්ෂිකව පැවැත්වෙන උක්ත තරගයෙහි 2025 වර්ෂයට නියමිත කොන්දේසි, උපදෙස් සහ නිර්මාණ ඉදිරිපත් කළ යුතු ශීර්ෂ පිළිබඳ තොරතුරු මේ සමග ඇත. මේ පිළිබඳව අදාළ ගුරුභවතුන් සහ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් දැනුවත් කර මෙම තරගයට ඔවුන්ගේ නිර්මාණ ඉදිරිපත් කරවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වමි.

මේ සඳහා ඉදිරිපත් වන සියලු ම තරගකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවක ම මෙම චක්‍රලේඛයේ සඳහන් සියලු කොන්දේසි පිළිපැදීමට එකඟ ව කටයුතු කළ යුතු ය.

නාලක කළුවැව
ලේකම්

# සමස්ත ලංකා පාසල් සංගීත තරගය (සිංහල මාධ්‍ය) - 2025

## හැඳින්වීම

මෙරට පාසල් සිසු දරුදැරියන්ට සහ ගුරුභවතුන්ට සංගීත විෂයානුබද්ධ නිර්මාණකරණයෙහි නිරත වීමට අවස්ථාවන් සම්පාදනයත්, එමගින් ඔවුන්ගේ ශිල්පීය කුසලතාවන් පෝෂණය කිරීම පිණිස ප්‍රායෝගික හා විෂයානුබද්ධ අත්දැකීම් රාශියක් ලබා දීමත්, එමෙන් ම ඔවුන්ගේ වින්දන ශක්තීන් දියුණු කිරීමත් උදෙසා මෙම තරගය සංවිධානය කෙරේ. මෙරට සෞන්දර්ය අධ්‍යාපනයේ පුරෝගාමීන්ගේ කැපවීම මත දශක කිහිපයක් ඔස්සේ විවිධ ස්වරූපයන්ගෙන් යුක්තව වැඩි දියුණු වෙමින් අඛණ්ඩව පැවැත ආ මෙය, වර්තමානයේ දී සංගීත අධ්‍යාපනයෙහි කාලීන අවශ්‍යතාවන්ට අනුකූල වැදගත් සහ අත්‍යවශ්‍ය වාර්ෂික වැඩසටහනක් ලෙසින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම තරගයේ දී ජාතික මට්ටමින් ඇගැයීමට ලක් කෙරෙන සිසු දරුදැරියන් උසස් අධ්‍යාපනයට යොමු වීමේ දී ප්‍රමුඛතාවට පත් වේ.

## <u>1 - තරගය පිළිබඳ පොදු උපදෙස්</u>

1.1 මෙවර තරගය, පහත පරිදි කාණ්ඩ කෙරෙන අතර, තම පාසලට ඉදිරිපත් වීමට මෙම චක්‍රලේඛයෙන් ඉඩ ලබා දී නැති කාණ්ඩයන්ට අයදුම් නොකළ යුතු ය.

- 6 - 13 ශ්‍රේණිවල මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 300 දක්වා පාසල් සඳහා - (තරග ශීර්ෂ A.1.1 සිට E.2.43 දක්වා)
- 6 - 13 ශ්‍රේණිවල මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 301 සිට 1000 දක්වා වන පාසල් සඳහා - (තරග ශීර්ෂ A.1.44 සිට E.2.97 දක්වා)
- 6 - 13 ශ්‍රේණිවල මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1001 හා ඊට වැඩි පාසල් සඳහා - (තරග ශීර්ෂ A.1.98 සිට E.2.157 දක්වා)
- සිසු සංඛ්‍යා අනුව කාණ්ඩ නොකර, පාසල්වලට පොදුවේ ඉදිරිපත් විය හැකි තරග (තරග ශීර්ෂ F.2.158 සිට F.5.181 දක්වා)
- ජාත්‍යන්තර පාසල් සහ එවැනි වෙනත් පෞද්ගලික පාසල් සඳහා පවත්වන, සිසු සංඛ්‍යා අනුව කාණ්ඩ නොකරන තරග (තරග ශීර්ෂ A.1.182 සිට E.2.193දක්වා).

1.2 සහභාගී වන තරගකරුවන් අයත් ශ්‍රේණි අනුව මෙම තරගය ප්‍රධාන කොටස් පහකට බෙදේ.

A. කනිෂ්ඨ කොටස - 6 සිට 9 ශ්‍රේණිය දක්වා
B. ජ්‍යෙෂ්ඨ 1 කොටස - 10 සිට 11 ශ්‍රේණිය දක්වා
C. ජ්‍යෙෂ්ඨ 2 කොටස - 12 සිට 13 ශ්‍රේණිය දක්වා
D. විවෘත කොටස - 6 සිට 13 ශ්‍රේණිය දක්වා
E. විශේෂ කොටස - 10 සිට 13 ශ්‍රේණිය දක්වා
F. පොදු කොටස - 6 සිට 13 ශ්‍රේණිය දක්වා (ශිෂ්‍ය සංඛ්‍යාව මත පදනම් නොවන පොදු ශීර්ෂ).

1.3 ඉහත සෑම කොටසක් ම පහත සඳහන් අංශ සියල්ලටම හෝ කිහිපයකට අයත් ශීර්ෂවලින් සමන්විත වේ.

1. ගායන අංශය
2. වාදන අංශය
3. නාට්‍ය සංගීත අංශය
4. ස්වර සාධනා අංශය
5. පරිගණක සංගීත අංශය

1.4 ඉහත අංශ ද ඒකල, යුගල සහ සමූහ වශයෙන් වඩාත් සුවිශේෂීව බෙදේ.

1.5 තරග ශීර්ෂ ගැහැණු, පිරිමි, හා මිශ්‍ර ලෙස වර්ග කර ඇත. (නාට්‍ය ගීත ජවනිකා සඳහා අදාළ නැත).

1.6 මෙහි ඒ ඒ තරග ශීර්ෂයන් ඉහත 1.2 හි සඳහන් කොටස් සඳහා වන ඉංග්‍රීසි අක්ෂරයක් සහ ඉලක්කම් ස්ථාන දෙකකින් ද යුක්ත වේ. එය පහත ආකාරයට අරුත් ගැන්වේ.

<u>ඉංග්‍රීසි අක්ෂරය</u> :- A:- කනිෂ්ඨ කොටස, B:- ජ්‍යේෂ්ඨ -1 කොටස, C:- ජ්‍යේෂ්ඨ - 2 කොටස

D:- විවෘත කොටස, E:- විශේෂ -1 කොටස, F:- විශේෂ - 2 කොටස

<u>පළමු අංකය</u> :- 1:- ගායන, 2:-වාදන, 3:-නාට්‍ය සංගීත, 4:-ස්වර සාධනා, 5:-පරිගණක සංගීත

<u>දෙවන අංකය</u> :- ඒ ඒ ශීර්ෂයන්ට අනුව අංක වෙනස් වේ.

1.7 සෑම විට ම තරග ශීර්ෂවලට අදාළ කොන්දේසි පෙළ ගස්වා ඇත්තේ අදාළ ශීර්ෂවලට පසුව බැවින්, යම් තරග කොන්දේසියක් අදාළ වන්නේ ඊට ඉහළින් දක්වා ඇති තරග ශීර්ෂයට හෝ ශීර්ෂවලට ය.

1.8 තරගයට ඉදිරිපත් වන අවස්ථාවේ දී අදාළ තරග ශීර්ෂය/ශීර්ෂ සඳහා චක්‍රලේඛයෙහි වෙන් කර ඇති උපරිම කාලය ඉක්මවා ඇති විටෙක, ඒ සඳහා උපරිම වශයෙන් තත්පර 15ක් දක්වා පමණක් සමා කාලයක් ලබා දීමට විනිශ්චය මණ්ඩලය අවධානය යොමු කරනු ඇත.

1.9 පූර්වාසන්න ජාතික මට්ටමේ තරගයේ දී ඉතා අවම සහභාගීත්වයක් පෙන්නුම් කළ ශීර්ෂවල ඉදිරි සහභාගීත්වය සහ තරගකාරීත්වය ඉහළ නැංවීම පිණිස, මෙවර පටන් F හෙවත් පොදු කොටස වශයෙන් එම ශීර්ෂ පැවැත්වෙන්නේ, ශිෂ්‍ය සංඛ්‍යාව මත පදනම් නොවූ පොදු තරග වශයෙනි. වාර්ෂිකව පූර්වාසන්න සංගීත තරගයේ සහභාගීත්වය සමාලෝචනයෙන් පසුව, ඉදිරි තරගයේ F හෙවත් පොදු කොටසට ශීර්ෂ ඇතුළත් කිරීම හෝ ඉන් ඉවත් කිරීම තීරණය වනු ඇත.

## <u>2. සහභාගීත්වය</u>

2.1 රජයේ පාසල් (පිරිවෙන් විද්‍යායතන ද ඇතුළත්ව), රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට මෙම තරගයේ A.1.1 සිට F.5.181 දක්වා වන ශීර්ෂවලට ඉදිරිපත් විය හැකි ය.

2.2 ජාත්‍යන්තර පාසල් සහ වෙනත් එවැනි පෞද්ගලික පාසල්වලට ඉදිරිපත් විය හැක්කේ, මෙම තරගයේ A.1.182 සිට E.2.193 දක්වා වන ශීර්ෂවලට පමණි.

2.3 එක් පාසලකට සහභාගී විය හැකි **උපරිම තරග ශීර්ෂ සංඛ්‍යාව තුනකි.**

- **ඕනෑම පාසලකට ඉදිරිපත් විය හැකි එම <u>උපරිම තරග ශීර්ෂ තුන සඳහා</u> සමූහ තරග ශීර්ෂ තෝරාගන්නේ නම් <u>උපරිම වශයෙන් සමූහ තරග ශීර්ෂ දෙකකට (02) පමණක් සීමා විය යුතුය.</u>**
- ඒ අනුව පහත ආකාරයට අනුව තරග ශීර්ෂ තෝරා ගත හැකි ය.
  - ඒකල තරග 03ක් පමණක්
  - ඒකල තරග 02ක් පමණක්
  - ඒකල තරග 01ක් පමණක්
  - සමූහ තරග 02ක් පමණක්
  - සමූහ තරග 01ක් පමණක්
  - සමූහ තරග 01ක් සහ ඒකල තරග 01ක් පමණක්
  - සමූහ තරග 01ක් සහ ඒකල තරග 02ක් පමණක්
  - සමූහ තරග 02ක් සහ ඒකල තරග 01ක් පමණක්

2.4 මෙම තරගයට යම් පාසලක 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන්ට සහභාගී වීමට හැකි අතර, තම විදුහල මගින් දෙවන වර උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ විභාගය සඳහා තරගය පවත්වනු ලබන වර්ෂයේ පෙනී සිටීමට හිමිකම් ලබන සිසු සිසුවියන්ට ද සහභාගී විය හැකිය. එහිදී කලාප මට්ටමින් තරග අයදුම්පත් කැඳවන අවස්ථාව වන විට දෙවන වර පාසල මගින් විභාගයට පෙනී සිට විභාග ප්‍රතිඵල ලබා ඇති සිසු සිසුවියන්ට මෙම තරගය සඳහා ඉදිරිපත් වීමට නොහැකිය. යම් හෙයකින් කලාප හෝ පළාත් හෝ තරගයට ඉදිරිපත් වී ඇති සිසු සිසුවියන්ට තරගාවලිය නිම වීමට පෙර පාසලෙන් අස්වීමේ සහතිකය ලබා

දී ඇති විටෙක වුව ද, ඉදිරි තරග අවස්ථා සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව හිමි වේ. තව ද, අ.පො.ස සා/පෙළ විභාගය (2024) සඳහා 2025 වර්ෂයේ දී පාසල් අයදුම්කරුවකු ලෙස පළමු හෝ දෙවන වර පෙනී සිටින සිසුන්ට මෙම තරගයේ ජෝෂ්ඨ 1, විවෘත, විශේෂ සහ පොදු යන කොටස් සඳහා සහභාගී විය හැකි ය.

2.5 පළාත් හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ, පළාත් හෝ කලාප සෞන්දර්ය/සංගීත විෂය භාර අධ්‍යක්ෂගේ/කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ඇතිව, **යම් පාසලකට එය අයත් වන පළාතේ ම** වෙනත් පාසලක සංගීත ගුරුභවතුන් හෝ සිසු සිසුවියන් හෝ **සහාය වාදනය** සඳහා සහභාගී කර ගත හැකි ය. එහි දී අදාළ පාසල්වල විදුහල්පතිවරුන්ගේ නිර්දේශය ලබා ගත යුතු ය.

2.6 සහාය වාදනය සඳහා සම්බන්ධ වන සිසු සිසුවියන්ට, ඔවුන් සහභාගී වන තරග ශීර්ෂයට නියමිත වයස් සීමාවන් හෝ ශිෂ්‍ය සංඛ්‍යා අනුව සිදු කර ඇති පාසල් කාණ්ඩ වර්ගීකරණය අදාළ නොවේ. සහාය වාදනය සඳහා 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන සිසු සිසුවියන්ට ඉදිරිපත් විය හැකි අතර එය ගැහැණු/පිරිමි ලෙස සීමාවන්ට ලක් නොකෙරේ. වාදනයෙන් සහාය වන්නන්ට ගායනයෙන් සහාය වීමට නොහැකි ය.

2.7 සහාය වාදනය සඳහා ගුරු භවතුන් සහභාගී වන්නේ නම්, උපරිමය දෙදෙනෙකුට සීමා විය යුතු ය.

2.8 තරගයට ඉදිරිපත් වන පාසලෙහි සේවයේ යෙදී සිටින, සංවර්ධන නිලධාරීන්ට, සංවර්ධන සහකාරවරුන්ට සහ රජයෙන් පත් කළ ගුරු සහායකයින්ට තම සේවයෙහි යෙදී සිටින පාසල සඳහා පමණක් සහාය වාදනයෙන් සහභාගී වීමට අවස්ථාව හිමි වේ. ඔවුනට වෙනත් පාසලකට සහාය වාදනයෙන් ඉදිරිපත් විය නොහැකි ය.

2.9 රජයේ පාසල්, පිරිවෙන් සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට, ජාත්‍යන්තර පාසල් සහ එවැනි වෙනත් පෞද්ගලික පාසලක ගුරුභවතුන් සහ සිසු සිසුවියන් සහාය වාදනය සඳහා යොදවා ගත නොහැකි ය. එමෙන්ම ජාත්‍යන්තර පාසල් සහ එවැනි වෙනත් පෞද්ගලික පාසල්වල ගුරු භවතුන් හෝ සිසු සිසුවියන් එම පාසල් අතර පමණක් සහාය වාදනය සඳහා යොදවා ගත හැකි ය.

2.10 **තබ්ලා වාදනයෙන් සහාය දැක්වීම හා සම්බන්ධයෙන් පහත කරුණ ද සැලකිල්ලට ගත යුතු ය.**

> චක්‍රලේඛයෙහි **<u>සුවිශේෂීව සඳහන් කර ඇති තරග ශීර්ෂ කිහිපයක් සඳහා</u>** තබ්ලාවෙන් සහාය වාදනයට සහභාගී විය යුත්තේ තම පාසලේ හෝ පාසල අයත් පළාත තුළ පාසල් සිසු සිසුවියන් පමණි. මෙම උපදේශය සඳහන් කර ඇති තරග ශීර්ෂ මේ යටතෙහි ලා ගැනේ.
>
> (මෙම තීරණය ගෙන ඇත්තේ පාසල් සිසුන් තුළ තබ්ලා වාදන කුසලතා ද ප්‍රවර්ධනය කිරීමේ අධ්‍යාපනික අවශ්‍යතාව පෙරදැරි කර ගෙන ය.)

2.11 කිසියම් තරගකරුවකු කලාප තරගයට අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඉගෙනුම ලබමින් සිටි ශ්‍රේණිය යටතේ ම සමස්ත ලංකා අවසාන තරගය දක්වාම ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි. එමෙන්ම වෙනත් පාසලකට ඇතුළත් වූ සිසු සිසුවියන්ට ද කලාප තරගයට අයදුම් කරන අවස්ථාවේ ඉගෙනුම ලබමින් සිටි පාසල නියෝජනය කරමින් අවසාන තරගය දක්වා සහභාගී විය හැකි ය.

2.12 එකම සිසුවකුට හෝ සිසුවියකට ඒකල තරග ශීර්ෂ එකකට වඩා ප්‍රධාන තරගකරු ලෙස ඉදිරිපත් විය නොහැකි ය. එසේ වුව ද ඒකල තරගයකට සහභාගී වන සිසුවකුට/සිසුවියකට සමූහ හෝ යුගල තරග ශීර්ෂ සඳහා මෙන් ම සහාය වාදනය සඳහා ද ඉදිරිපත් වීමට හැකියාව ඇත.

2.13 පසුගිය වසරේ (2024) පැවැති මෙම තරගයේ ජාතික මට්ටමේ තරග වටයේ දී ඒකල තරග ශීර්ෂවලින් ප්‍රථම ස්ථාන ලබාගත් සිසු සිසුවියන්ට මෙවර තරගයෙහි ඒකල තරග ශීර්ෂවලට ඉදිරිපත් විය නොහැකි ය. එහෙත් සහාය වාදනයට සහ සමූහ තරග ශීර්ෂ සඳහා සහභාගී වීමට ඔවුනට අවස්ථාව ඇත.

2.14 ''සමූහ - මිශ්‍ර'' ගායන/වාදන තරගවල දී ගායනය සඳහා සහභාගී වන ශිෂ්‍යයන්ගේ සහ ශිෂ්‍යාවන්ගේ සංයුතිය එක් වර්ගයකින් 4 දෙනෙකුට වඩා නො අඩු විය යුතු ය.

2.15 තරගය සඳහා යොදා ගැනෙන ගී පදමාලා ආදිය ජාති ආගම්, කුල භේදවලට හෝ පටු දේශපාලනික අදහස්වලට තුඩු නොදෙන, එවැනි අදහස් ගම්‍ය නොවන, පාසල් සිසුන්ට උචිත ඒවා විය යුතු ය.

2.16 කිසිදු තරග ශීර්ෂයක් සඳහා වේදිකා පසුතල නිර්මාණ, වේදිකා අලංකරණ උපාංග, සැරසිලි හා නිර්මාණාත්මක උපාංග කිසිවක් භාවිත නොකළ යුතු ය.

2.17 තරග අවස්ථාවන්හි දී සුවිශේෂී ප්‍රාසංගික ඇඳුම් ආයිත්තම්වලින් සැරසී තරගයට ඉදිරිපත් වීම නොකළ යුතු අතර, පාසල් නිල ඇඳුමෙන් පමණක් සැරසී සිටිය යුතුය. නාට්‍ය ගීත ජවනිකා සහ නූර්ති/නාඩගම් ශීර්ෂවලට අදාළව පහත 2.18හි සඳහන් කොන්දේසි බල පැවැත්වේ.

2.18 නාට්‍ය ගීත ජවනිකා තරග ශීර්ෂ සඳහා පළාත් සහ අවසාන තරග අවස්ථාවන්හි දී පමණක් තරගකරුවන් (ගායන, වාදන සහ රංගන) අදාළ ප්‍රාසංගික ඇඳුම් පැළඳුම්වලින් සැරසී ඉදිරිපත් විය යුතු ය. එමෙන් ම ජවනිකාවෙහි නළු නිළියන් හා ගායක කණ්ඩායමට අදාළ පරිදි, රංග භාණ්ඩ යොදා ගත හැකි ය.

2.19 තරගයට ඉදිරිපත් වීම සඳහා වේදිකාවට පිවිසි පසුව සංගීත භාණ්ඩ ආදිය සූසර කිරීමට විනාඩි 02කට වැඩි කාලයක් නොගත යුතු ය.

2.20 වෙනත් මණ්ඩලයක ප්‍රමාදයක් හේතුවෙන් යම් පාසලක් මණ්ඩලයකට ඉදිරිපත් වීමට ප්‍රමාද වන්නේ නම් කාල සටහනේ පාසල් සටහන් කර ඇති අනුපිළිවෙල නොතකා එම ශීර්ෂයේ අනෙකුත් පාසල් ඉදිරිපත් කිරීම සඳහා කැඳවීමට සංවිධායක මණ්ඩලයට බලය ඇත.

## 03. තරගයට ඉදිරිපත් වීම

3.1 පළමු තරග අවස්ථාව වන කලාප තරගය සඳහා මෙම චක්‍රලේඛයෙහි අවසානයට ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉල්ලුම් පත්‍රය පුරවා අදාළ කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් තම කලාපයේ සෞන්දර්ය හෝ පෙරදිග සංගීත විෂය භාර සහකාර/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ සංගීත ගුරු උපදේශකවරුන්ගෙන් උපදෙස් ලබා ගත යුතු ය.

3.2 යම් තරග ශීර්ෂයකට සහභාගී විය හැකි තරගකරුවන්ගේ උපරිම හා අවම සංඛ්‍යාවන් ඒ ඒ ශීර්ෂ කාණ්ඩවලට අදාළ තරග කොන්දේසි යටතේ දක්වා ඇත. තරග අවස්ථාවේ දී සහාය වාදන සඳහා හෝ වාදක මණ්ඩලය මෙහෙය වීම සඳහා හෝ ගුරුභවතා/ගුරුභවතුන් සහභාගී වන්නේ නම්, ඔවුන් ද සහභාගී වන තරගකරුවන්ගේ සංඛ්‍යාවෙහි ලා සලකනු ලැබේ.

3.3 තරගකරුවන් සංඛ්‍යාව ලෙස මෙහි දී සැලකෙන්නේ, ප්‍රසංග අංකය ඉදිරිපත් කර අවසාන වන කාලය තෙක් විනිශ්චය මණ්ඩලය අභිමුවෙහි හෝ වේදිකාවේ සිටින සංඛ්‍යාව ය. යම් හදිසි අවස්ථාවක දී තරගකරුවෙකු තරගය සඳහා ඉදිරිපත් නොකරන්නේ නම් ඔහුගේ/ඇයගේ නම ඉල්ලුම් පත්‍රයෙන් ඉවත් කළ යුතු ය. කලාප, පළාත් සහ අවසාන තරග අවස්ථාවන් හි දී සංවිධායක මණ්ඩලය ඉදිරියේ අත්සන් කළ යුත්තේ ද ඉදිරිපත් වන සිසු සිසුවියන් සහ ගුරුභවතුන් පමණි.

3.4 සෑම තරගකරුවෙක්ම/ සහභාගී වන්නෙක්ම පහත ආකාරයට තම අනන්‍යතාව තහවුරු කළ යුතු ය. කලාප තරග අවස්ථාවට විදුහල්පති සහතික කළ නාමලේඛනය ප්‍රමාණවත් ය. පළාත් සහ අවසාන තරග අවස්ථාවන්හි දී, කනිෂ්ඨ කොටසට විදුහල්පති සහතික කළ ඡායාරූපයක් සහ නාමලේඛනය ප්‍රමාණවත් අතර ජ්‍යෝෂ්ඨ කොටසට විදුහල්පති සහතික කළ නාමලේඛනය සමග පිළිගත් ඕනෑම අනන්‍යතා පත්‍රයක් හෝ හැඳුනුම්පතක් හෝ ඉදිරිපත් කළ යුතු ය.

3.5 සියලු ම තරග ශීර්ෂ සඳහා ඉදිරිපත් වන සිසු, ගුරු නාමලේඛනය විදුහල්පති විසින් සහතික කර නිල මුද්‍රාව තබා පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු ය. තරග අවස්ථාවන්හි දී අනන්‍යතාව පිළිබඳ ගැටලුවක් පැන නැගී විටෙක දී උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතු වේ.

3.6 යම් ශීර්ෂයක් සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී මෙන් ම, කලාප, පළාත් සහ අවසාන යන සෑම තරග අවස්ථාවක දී ම මෙහි අවසානයට ඇති ආදර්ශ අයදුම්පත්‍රය පුරවා සහතික කර රැගෙන ආ යුතු ය. ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී යතුරු ලියනය නොකරන්නේ නම් ඉතා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වේ. නම්වල මුල් අකුරු ඉංග්‍රීසියෙන් ලිවිය යුතු ය. එසේ

ම වෙනත් පාසල්වලින් ගුරුවරුන් හා සිසුන් සහාය වාදනයට සහභාගී වන්නේ නම්, ඉහත සඳහන් කළ ආකෘතියෙහි ම අදාළ තොරතුරු සඳහන් කළ යුතු ය.

3.7 සෑම තරග අවස්ථාවක් සඳහා ම අංග සම්පූර්ණ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර යම් පාසලක් තරග ශීර්ෂ කිහිපයකට ඉල්ලුම් කිරීමේ දී, එක් තරග ශීර්ෂයකට එක බැගින් වෙන වෙන ම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය. නාමලේඛන සකස් කිරීමේ දී අදාළ ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ නමට ඉදිරියෙන් ශිෂ්‍යාව/ශිෂ්‍යයා වශයෙන් ද ගුරුභවතුන්ගේ නමට ඉදිරියෙන් මෙය/මිය/මයා වශයෙන් ද සඳහන් කළ යුතු ය.

3.8 තමන් අයදුම් කළ යුතු නිවැරදි තරග ශීර්ෂයට අයදුම් කිරීමේ පූර්ණ වගකීම අදාළ විදුහල සතු ය. අයදුම් කළ පසුව තරගයට ඉදිරිපත් වීමේ දී ද, ඊට පෙර තමන් නිවැරදි තරග ශීර්ෂයට අයදුම් කළේ ද යන්න පරීක්ෂාකාරී වීමේ වගකීම ද එම විදුහලේ අදාළ ගුරු භවතුන් සහ විදුහල්පති සතු ය. වැරදි තරග ශීර්ෂයකට අයදුම් කර, වැරදි ශීර්ෂයකට ඉදිරිපත් වූ බව ද අනාවරණය නො වී එය කලාප හෝ පළාත් තරගයෙන් ඊට ඉහළ මට්ටමට ඉදිරිපත් කිරීමට නියමිතව පැවැතිය ද, එම දෝෂය අනාවරණය වූ පසුව, එය එම තරග මට්ටමට, එ නම් පලාත් හෝ අවසාන මට්ටමට ඉදිරිපත් නොකළ යුතු ය.

## 04. <u>කලාප/පළාත් තරග සංවිධානය</u>

4.1 කලාප තරගය අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ විෂය ගුරු උපදේශකගේ සහාය ඇතිව සංවිධානය කළ යුතු වේ. කලාප තරගයේ සියලු වගකීම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරෙන අතර, ඔහු/ඇය මෙම චක්‍රලේඛයෙහි උපදෙස් උල්ලංඝනය නොවන පරිදි කලාප තරග ප්‍රතිඵලවල අවසන් තීරක ද වන්නේ ය. කලාප තරග **2025.06.01** දින වන විට පවත්වා, අදාළ ප්‍රතිඵල ලේඛන පළාත් තරග සංවිධානය සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

4.2 පළාත් තරගය අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සංවිධානය කළ යුතු ය. මෙම කටයුතුවල දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට පළාතේ අදාළ විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහාය විය යුතුය. අවශ්‍ය අවස්ථාවල දී පමණක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ එකඟතාව සහිතව එම පළාතට අයත් සෞන්දර්ය විෂය භාර නිලධාරියකු, සම්බන්ධීකරණ/සංවිධායක නිලධාරියා වශයෙන් නම් කෙරෙනු ඇත.

4.3 පළාත් තරගයේ සියලු වගකීම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරෙන අතර, මෙම චක්‍රලේඛයෙහි උපදෙස් උල්ලංඝනය නොවන පරිදි ඔහු/ඇය පළාත් තරග ප්‍රතිඵලවල අවසන් තීරක වේ. යම් විෂයානුබද්ධ ගැටළුවක් පැන නැගී අවස්ථාවක දී පළාතේ අදාළ විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ තීරණ ගත යුතුය. පළාත් තරග **2025.07.27** දින වන විට පවත්වා, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කළ ප්‍රතිඵල ලේඛන, අවසාන තරග සංවිධානය සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය.

4.4 අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාවෙන් සකසා ලබා දෙන Google පෝරමයට පළාත් ප්‍රතිඵල සිංහල යුනිකෝඩ් අක්ෂරයකින් ඇතුළත් කර එවිය යුතු අතර ම පළාත් තරග ප්‍රතිඵල ලේඛනයේ PDF පිටපතක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාවේ <u>aestheticeducation.moe.sl@gmail.com</u> යන ඊ මේල් ලිපිනයට ද එවිය යුතු ය.

4.5 කලාප මට්ටමට පෙනී සිට ජයග්‍රහණය කළ සිසු සිසුවියන් ම පළාත් මට්ටමට ද, පළාත් මට්ටමට පෙනී සිට ජයග්‍රහණය කළ සිසු සිසුවියන් ම ජාතික මට්ටමට ද පෙනී සිටීම අනිවාර්ය වේ. මේ සම්බන්ධයෙන් නොවැළැක්විය හැකි යම් ගැටලුවක් මතු වුවහොත්, පාසලේ විදුහල්පතිගේ නිර්දේශ මත කලාප තරග මට්ටමේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේත්, පළාත් තරග මට්ටමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේත්, සමස්ත ලංකා තරග මට්ටමේ දී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන

අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය මත පමණක් එම ගැටලුව නිරාකරණය කර ගත යුතුය.

4.6 යම් තරග ශීර්ෂයකින් කලාප තරගයකට ඉදිරිපත් නොවූ කිසිදු පාසලක්, පළාත් තරග අවස්ථාවට සහභාගී නොකිරීමටත්, පළාත් තරග අවස්ථාවට සහභාගී නොවන පාසලක් අවසන් තරගය සඳහා ඉදිරිපත් නොකිරීමටත්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ කලාපයේ විෂය භාර අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ පළාත් සෞන්දර්ය අධ්‍යක්ෂ /සම්බන්ධීකරණ නිලධාරී වග බලා ගත යුතු ය

4.7 කලාප/පළාත්/අවසාන තරග අවස්ථාවල දී කුමන හේතුවක් නිසා හෝ සම ස්ථාන ලබා නො දිය යුතු ය. මෙහි පූර්ණ වගකීම පිළිවෙලින් කලාප/පළාත්/ අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත පැවරේ. සමස්ත ලංකා වටයට කැඳවනු ලබන්නේ පළාත් මට්ටමේ තරගයෙන් ප්‍රථම ස්ථානය දිනාගත් පාසල් පමණි. මෙම කොන්දේසිවලට පරිබාහිර විය හැකි අවස්ථා අදාළ ශීර්ෂ ආශ්‍රිතව සටහන් කර ඇත.

4.8 කලාප මට්ටමේ ඇතිවන ගැටලුවක් එම මට්ටමේදී නොවිසදා එය විසදීම පළාත් මට්ටමටත්, පළාත් මට්ටමේ ඇති වන ගැටලුවක් එම මට්ටමේදී ම නොවිසදා එය විසදීම රේඛීය අමාත්‍යාංශ මට්ටමටත් නොඑවිය යුතු ය. ගැටලුව ඇති වූ මට්ටමේ දී ම එය විසදා මෙම චක්‍රලේඛයෙන් නියම කර ඇති ප්‍රතිඵලය පමණක් ඊට ඉහළ මට්ටමට යොමු කිරීම අදාළ නිලධාරීන්ගේ වගකීම වේ.

## **5.** <u>තරග විනිශ්චය</u>

5.1 කලාප තරග විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලය අදාළ කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, පළාත් තරග විනිශ්චය කටයුතු සඳහා වන විනිශ්චය මණ්ඩලය අදාළ පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, තම කලාප/පළාත් සෞන්දර්ය හෝ සංගීත විෂය භාර නිලධාරීන්ගේ නිර්දේශ මත පත් කළ යුතු ය. කලාප/පළාත් තරග අවස්ථාවන්හි දී යම් තරග ශීර්ෂයක විෂයානුබද්ධ ගැටලුවක් මතු වී ඇති විටෙක ඒ පිළිබඳව යම් තීරණයක් ගත යුතු යැයි හැගේ නම් පමණක්, අධ්‍යාපන ලේකම්ගේ එකඟතාව මත විනිශ්චය මණ්ඩලය සමඟ සාකච්ඡා කර තීරණයකට එළැඹෙනු ඇත.

5.2 කලාප/පළාත් තරග සඳහා සුදුසු විනිශ්චය මණ්ඩලයක් නිර්දේශ කිරීම අදාළ කලාපයේ/පළාතේ සෞන්දර්ය හෝ සංගීත විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ මෙන් ම අදාළ විෂය ගුරු උපදේශකගේ/උපදේශකවරුන්ගේ ද වගකීම වේ. **මේ සඳහා සේවයේ යෙදී සිටින ගුරුභවතුන් යොදා නොගත යුතු ය.** විනිශ්චය ලබා දීමේ දී අපක්ෂපාතීව, වගකීම් සහගතව සහ පරිණතභාවයෙන් යුතුව එහි නිරත විය හැකි ප්‍රවීණයන් ඒ සඳහා නිර්දේශ කිරීමත්, තරග කොන්දේසි හා නීති රීති ඇතුළු අදාළ අනෙකුත් කාරණාවන් පිළිබඳව විනිශ්චය මණ්ඩලය මැනැවින් දැනුවත් කිරීමත් අදාළ කලාපයේ/පළාතේ සෞන්දර්ය අධ්‍යක්ෂගේ සහ සංගීත විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂගේ මෙන් ගුරු උපදේශකගේ ද වගකීම වේ.

5.3 ජාතික වටයේ විනිශ්චය මණ්ඩලය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශයේ සංගීත විෂය පවරා ඇති නිලධාරීගේ නිර්දේශ මත හෝ මෙම තරගයේ අවසාන වටයේ රාජකාරි ඉටු කිරීම පිණිස පත් කෙරෙන මෙහෙයුම් කමිටුවක නිර්දේශ මත අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කෙරෙනු ඇත.

5.4 අදාළ තරග අවස්ථාවෙන් පසුව සියලු ම විනිශ්චය සටහන් පත්‍රිකා අදාළ කලාප/පළාත් අධ්‍යක්ෂවරයාගේ අත්සන සහිතව සුරැකිව තබා ගැනීම කලාපයේ/පළාතේ සෞන්දර්ය/සංගීත විෂය භාර අධ්‍යක්ෂගේ වගකීම වේ. තරගයෙන් පසුව ඊට සම්බන්ධ වූ යම් පාසලක විදුහල්පති හෝ කලාප/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ විසින් හෝ නිරීක්ෂණයට ඉල්ලා සිටියහොත්, තරග ශීර්ෂයට අදාළ එම සටහන් නිරීක්ෂණයට ඉඩ ලබා දිය යුතු ය.

5.5 තරගයේ දී කිසියම් ඒකල හෝ සමූහ හෝ තරග ශීර්ෂයකට තරග වදින කණ්ඩායම් සියල්ල හෝ කිහිපයක් හෝ එකක් හෝ අවශ්‍ය සාධන මට්ටම, එනම් ලකුණු 40%ක් වන අවම සාධන ලකුණු මට්ටම ඉක්මවා නැති බව විනිශ්චය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී එම කණ්ඩායමට හෝ කණ්ඩායම්වලට ජයග්‍රහණය ලබා නො දෙනු ඇත.

5.6 කලාප /පළාත් හා ජාතික තරග පවත්වන දිනයේ දී ම අදාළ තරග ශීර්ෂයන්හි ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ. යම් ආකාරයකින් මේ සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් පැන නැගී ඇති විටෙක, අදාළ පරීක්ෂණවලින් පසුව එම ප්‍රතිඵල නිකුත් කෙරේ. සමස්ත තරග මාලාවෙහි තරග අවස්ථාවන්හි දී විනිශ්චයන් හා සම්බන්ධව විනිශ්චය මණ්ඩල සමග කරුණු සාකච්ඡා කිරීමට තරගකරුවන්ට හෝ ගුරු භවතුන්ට අවස්ථාවක් නොලැබෙන අතර, ඒ පිළිබඳ යම් අදහසක් වේ නම් ප්‍රධාන තරග සංවිධායක වෙත පමණක් ලිඛිත ව කරුණු ඉදිරිපත් කළ යුතු ය.

5.7 තරගයේ කිසියම් අදියරක දී, ඊට සම්බන්ධ යම් පාර්ශවයක් යම්කිසි වංචනික ක්‍රියාවක නිරත වීම මගින් හෝ වෙනත් ආකාරයකින් තරග ප්‍රතිඵලවලට බලපෑමක් ඇති කර තිබෙන බවට කවර හෝ අවස්ථාවක දී වුවද අනාවරණය වුවහොත් සහ එය පිළිගත හැකි සහ වගකීම් සහගත අනාවරණයක් නම්, ඒ පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය පියවර ගනු ලැබේ.

5.8 යම් තරග ශීර්ෂයක ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව, වැඩි ලකුණු ලබාගත් පාසලකට විරුද්ධව යම් කිසි අභියාචනයක් ඉදිරිපත් වී, චෝදනාවේ බරපතලකම අනුව අදාළ පාසල එම තරග ශීර්ෂයෙන් ඉවත් කරන්නේ නම්, ඊළග ඉහළ ම ලකුණු මට්ටම ලබාගත් පාසල්වලට ජයග්‍රහණ අවස්ථා පිළිවෙලින් හිමි වේ.

## 06 අදාළ වෙනත් කරුණු

6.1 මෙම තරගයේ දී වාර්ෂික චක්‍රලේඛය මගින් නම් කරන ශීර්ෂ සඳහා පමණක් ශ්‍රැතිය පවත්වා ගැනීමට ඉලෙක්ට්‍රොනික තාම්පුරාවක් භාවිත කළ හැකි අතර ඇතැම් තරග ශීර්ෂ සඳහා සහාය වාදන භාණ්ඩයක් ලෙස විදුලි ඕගනයක් ද (Key Board) යොදාගත හැකි ය. මෙම උපදේශ සඳහන් කර ඇති තරග ශීර්ෂ මේ යටතෙහි ගැනේ. අනෙකුත් සියලු ම තරග ශීර්ෂ සඳහා විද්‍යුත් සංගීත භාණ්ඩ භාවිත කළ නොහැක.

6.2 භාවිත කරනු ලබන ඉලෙක්ට්‍රොනික තාම්පුරා/ඕගන් සඳහා තරගය පවත්වනු ලබන විදුහලේ විදුලිය පරිපථයෙන් විදුලිය සම්පාදනය නො කෙරේ. ඉලෙක්ට්‍රොනික් තාම්පුරා හඬ භාවිතය සඳහා ජංගම දුරකථන ද භාවිත කළහැකි අතර, ඒ සඳහා අවශ්‍යනම් හඬ ප්‍රවර්ධනය කරගැනීම සඳහා ප්‍රමාණවත් ස්පීකරයක් යොදාගත හැකි ය. මෙහිදී සිදුවන තාක්ෂණික දෝෂ සහ වෙනත් බාධාවන් පිළිබඳ තරග සංවිධායකයින් හෝ විනිශ්චය මණ්ඩලය වගකීමට නොබැඳේ.

6.3 ඒකල හාර්මෝනියම් තරග ශීර්ෂ යටතේ ඉදිරිපත් වන තරගකරුවන් "ස්කේල් චේන්ජර්" හාර්මෝනියම් භාවිතා කරන්නේ නම්, යතුරු පුවරුව වෙනස් කිරීමකින් තොරව වාදනය කළ යුතු ය.

6.4 සමූහ ගායන ශීර්ෂ සඳහා වාදනයෙන් සහාය වන්නන් හට ගායනයෙන් සහාය වීම කිසිසේත්ම සිදු කළ නොහැකි ය.

6.5 පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව ගණනය කිරීමේ දී 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා, එනම් ප්‍රාථමික ශ්‍රේණිවල ශිෂ්‍ය සංඛ්‍යාව අත හැර ගණනය කෙරේ.

6.6 කලාප තරග පැවැත්වීමේ දී සහභාගී වන පාසල් සංඛ්‍යාව සහ ඉදිරිපත් වන තරග ශීර්ෂ සංඛ්‍යාව අනුව දින ගණන තීරණය කිරීමේ වගකීම, ඒ ඒ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පැවරේ.

6.7 පරිගණක සංගීත ශීර්ෂයේ ජාතික මට්ටමේ තරගය, අනෙකුත් තරග පවත්වන දිනයේ දී හෝ වෙනත් දිනයක දී අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පවත්වන අතර, සමස්ත ඉදිරිපත් වීම අනුව අවශ්‍ය නම් පළාත් වටයන් සම්බන්ධයෙන් සහ සහභාගීත්ව අවස්ථා සම්බන්ධයෙන් ද සුවිශේෂ තීරණයන්ට එළැඹීමට ඉඩ ඇත. ඇගැයීම් නිර්ණායක සහ කලාප තරගයේ දී නිර්මාණයට අවශ්‍ය පද මාලා, කලාප තරගයට අයදුම් කළ සංඛ්‍යාවන් ප්‍රසිද්ධ කිරීමේ දී ඒ සමගම දැනුම් දෙනු ලැබේ. පළාත් තරගවලට වෙනම පදමාලා සපයනු ඇත. (සවිස්තර තොරතුරු අදාළ ශීර්ෂය පිළිබඳ තොරතුරු සමග සටහන් කර ඇත).

## 07 සහතික පත්‍ර හා ජය සංකේත

7.1 කලාප හා පළාත් මට්ටමේ තරගවලින් ජයග්‍රහණය ලබා ගන්නා සිසුන්ට සහතික පත්‍ර පිරිනැමීම කලාප හා පළාත් මට්ටමින් සිදු කළ යුතු වේ. ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සහතික පත්‍ර පිරිනමනු ලැබේ. මෙහි දී ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන ලද ජයග්‍රාහකයන් සහ ඇගැයීම් මණ්ඩලයෙන් නිර්දේශිත විශේෂ කුසලතා සහතිකලාභීන් හැරුණුකොට ඉතිරි සියලු දෙනාට සහභාගීත්ව සහතික පිරිනැමේ.

7.2 ජාතික මට්ටමේ සහතික ඉංග්‍රීසි බසින් සකස් වන බැවින් ඒ ඒ පළාත් මට්ටමේ තරගවලින් ප්‍රථම ස්ථානය ලබා ගන්නා පාසල් ඒ වන විට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කෙරෙනු ඇති MS Excel හෝ Google Sheet ආකෘතියට තම තොරතුරු ඇතුළත් කර මාර්ගගතව එවිය යුතු ය. සහතිකවල මුද්‍රණය වන්නේ එසේ එවන තොරතුරු බැවින් නම්වල අක්ෂර නිරවද්‍යතාව ආරක්ෂා වන ලෙස ඒවා යතුරුලියනය කර එවීම අදාළ විදුහලේ වගකීමකි. තරගයට ඉදිරිපත් වීමේ දී තමන් මාර්ගගතව එවූ එම තොරතුරු ලේඛනයේ මුද්‍රිත පිටපතක් විදුහල්පති මගින් සහතික කර රැගෙනවිත් අදාළ තරග මණ්ඩලයට තම අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී එය සමග භාර දිය යුතු ය.

7.3 මෙම තරගයේ ඉදිරිපත් වන ශීර්ෂ අනුව **ජාතික මට්ටමේ** තරගයේ පහත සඳහන් ශීර්ෂවල ප්‍රථම ස්ථාන ජයග්‍රහණයන්ට පහත නම් කර ඇති සම්මාන නාමයන් ප්‍රදානය කෙරේ.
**සමූහ තරග ශීර්ෂ :-**

- ශාස්ත්‍රීය සංගීත අංශ සඳහා — ලයනල් එදිරිසිංහ සම්මානය
- ජන සංගීත වාදන අංශ සඳහා — ඩබ්.බී.මකුලොලුව සම්මානය
- ජන සංගීත ගායන අංශ සඳහා — සී.ද.එස් කුලතිලක සම්මානය
- නිර්මාණ සංගීත අංශ සඳහා — සරත් දසනායක සම්මානය
- සංගීතමය නාට්‍ය අංශ සඳහා — එදිරිවීර සරච්චන්ද්‍ර සම්මානය
- සමූහ වාදන අංශ සඳහා — සෝමදාස ඇල්විටිගල සම්මානය
- වෙනත් ව්‍යවහාරික සංගීත ගායන අංශ සඳහා — ඩබ්.ඩී.අමරදේව සම්මානය
- වෙනත් ව්‍යවහාරික සංගීත වාදන අංශ සඳහා — ප්‍රේමසිරි කේමදාස සම්මානය

**ඒකල තරග ශීර්ෂ** :- ජ්‍යෙෂ්ඨ 2 කොටසේ උත්තර භාරතීය ශාස්ත්‍රීය ඒකල තරගවලින් ලකුණු 75% සිට ඉහළට ලබා ගන්නා ජයග්‍රාහකයන්ට "සංගීත් අභිමානි" සම්මාන නාමය ප්‍රදානය කෙරේ.

## 08. විනය සහ වගවීම - පිළිබඳ අදහස්

8.1 එක් එක් තරග අවස්ථාවට සහභාගී වීමට තරග මධ්‍යස්ථානවලට සහ නේවාසික මධ්‍යස්ථානවලට පැමිණෙන සිසු සිසුවියන්ගේ විනය, හැසිරීම, ආරක්ෂාව හා භාරකාරත්වය පිළිබඳව විදුහල්පතිවරුන්ගේ සහ කණ්ඩායම් භාර ගුරු මහත්ම මහත්මීන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

8.2 ශිෂ්‍යාවන්ගේ භාරකාරත්වය ගුරු මහත්මීන්ට ද, ශිෂ්‍යයින්ගේ භාරකාරත්වය ගුරු මහත්වරුන්ට ද, පැවරිය යුතු ය. ශිෂ්‍යයින් හා ශිෂ්‍යාවන් යන දෙපිරිස ම සහභාගී වන විට ගුරු මහත්ම මහත්මීන් යන දෙපාර්ශවයට ම භාරකාරත්වය පැවරිය යුතු ය.

8.3 තරග පරිශ්‍රය සහ ක්‍රියාකාරකම්වල දී තම පාසල නියෝජනය කරමින් සහභාගී වන්නන්ගෙන් කිසියම් අයථා සිදුවීමක් සිදුවුවහොත් ඒ සඳහා භාරකරුවන් ලෙස සහභාගී වන ගුරුභවතුන් මෙන් ම අදාළ පාසල්වල විදුහල්පතිවරුන් ද වගකීමට බැඳේ. තරගය හා සම්බන්ධ කිසිදු අවස්ථාවක් සඳහා දෙමාපියන් සහ වෙනත් සුබපතන්නන් හෝ පාර්ශවකරුවන් සහභාගී කර නොගත යුතු ය.

8.4 මෙම තරගය සඳහා අයදුම් කර ඉදිරිපත් වන සියලු ම පාසල් හා අනෙකුත් අදාළ පාර්ශවකරුවන්, තරගයේ සෑම අවස්ථාවක දී ම මෙහි සඳහන් සියලු ම නීති රීති හා විධිවිධාන අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතු වේ.

8.5 මෙම තරගයේ සෑම අවස්ථාවක දී ම යම් විදුහලක් පිළිබඳ නීතිමය හා විනය ආශ්‍රිත කටයුතු සිදු වනුයේ අදාළ විදුහලේ විදුහල්පති ද, කලාප හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ මැදිහත් වීමෙනි. පාසලේ වෙනත් පාර්ශවයන් එම කටයුතුවලට මැදිහත් කර නොගැනීමේ වගකීම ද අදාළ පාසලේ විදුහල්පතිවරයා වෙත සෘජුව ම පැවරේ.

8.6 කිසිදු හේතුවක් මත යම් පාසලකට මෙම උපදෙස් පරිශීලනය කිරීමට නොහැකි වීම හෝ නොකිරීම නිදහසට කරුණක් නොවන අතර, ඉන් සිසු සිසුවියනට සිදු විය හැකි හානි, නොසැලකිලිමත් බවේ හා වගකීම් විරහිත බවේ ප්‍රතිඵල ලෙස සලකා ඊට වගකිව යුතු පාර්ශවයන්ට අදාළ විනයානුකූල පියවර ගනු ලැබේ.

8.7 තරගයට සහභාගී වන්නන්, පාර්ශව කරුවන්, සිසු සිසුවියන්, ගුරු භවතුන්, නිලධාරීන්, තරග විනිසුරුවන් ආදීන්ගේ මෙන්ම පාසල් සහ අධ්‍යාපන ආයතනයන්හි පෞරුෂයට, ප්‍රතිරූපයට, අභිමානයට සහ ගෞරවයට හානිදායක වන සහ අගතියට පත් වන දේ සිදු කරමින් ක්‍රියාකරනු ලබන හෝ එවැනි දේ ප්‍රසිද්ධ කරනු ලබන අයට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ.

මෙම තරගය සඳහා ඉදිරිපත් වන සියලු ම තරග කරුවන් හා අනෙකුත් පාර්ශව කරුවන් තරගයේ සෑම අවස්ථාවක දී ම මෙම තරග චක්‍රලේඛයෙහි සඳහන් සියලු ම නීති රීති පිළිපැදීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් එකඟ විය යුතු ය. සමස්ත ලංකා මට්ටමෙහි අවසාන තරගයට ඉදිරිපත් වන පාසල් සඳහා ලබා දෙන තරග කාල සටහන් ගොනුවෙහි අමුණා ඇති ප්‍රකාශය හොඳින් කියවා තේරුම් ගෙන විදුහල්පති විසින් නියමිත ස්ථානයෙහි අත්සන් යොදා තරගයට ඉදිරිපත් විය යුතු ය. මෙම චක්‍රලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට හෝ පටහැණිව කටයුතු කර ඇති බව අනාවරණය වුවහොත් තරගයේ කුමන අවස්ථාවක දී වුව ද ප්‍රතිඵල ලේඛනවලින් එම විදුහල ඉවත් කිරීම, විනයානුකූල පියවර ගැනීම ඇතුළු අදාළ වෙනත් තීරණ ගැනේ.

# සමස්ත ලංකා පාසල් සංගීත තරගය 2025 - තරග ශීර්ෂ (සංශෝධිත)

## 6 – 13 ශිෂ්‍ය සංඛ්‍යාව 300ට අඩු පාසල් - (A.1.1 සිට E.2.43 දක්වා)

### 01. කනිෂ්ඨ කොටස (6 - 9 ශ්‍රේණිවල සිසුන් සඳහා)

A.1.1 ඒකල ගායනය - (කනිෂ්ඨ) ගැහැණු/රාගධාරී/ නියමිත රාගය - කාෆි
A.1.2 ඒකල ගායනය - (කනිෂ්ඨ) පිරිමි/රාගධාරී/ නියමිත රාගය - බිලාවල්

ඉහත A.1.1 සහ A.1.2 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- හින්දි බසින් රචිත ඛ්‍යාල් ශෛලියේ මධ්‍යලය ගීතයක් විය යුතු ය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය ගායනා අංගවලින් පෝෂිත විය යුතු ය.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කළ නොහැක.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව හෝ ජංගම දුරකථන යෙදවුම් (apps) මගින් තාම්පුරා හඬ භාවිතා කළ හැක. එහි දී චක්‍රලේඛයෙහි 6.2 වගන්තියට අනුකූල විය යුතු ය.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 04කි.

A.1.3 ඒකල ගායනය - (කනිෂ්ඨ) ගැහැණු/සරල ගී ‘‘උඩඟු ලියන් ගොතා බඳින’’ - නන්දා මාලනී
A.1.4 ඒකල ගායනය - (කනිෂ්ඨ) පිරිමි/ සරල ගී ‘‘අන්දරයායේ’’ - කරුණාරත්න දිවුල්ගනේ

ඉහත A.1.3 සහ A.1.4 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- තෝරා ගත් ගීතයෙහි පෙර වාදන, අතුරු වාදන සහ ගීතයේ තනුව වෙනස් නොවන පරිදි (මුල් නාද මාලාවට හානි නොවන පරිදි) ඉදිරිපත් කළ යුතු ය.
- ගීතය ගායනය/ වාදනය සඳහා තෝරා ගන්නා ස්කේලයම (Scale) ගීතයෙහි ආරම්භයේ සිට අවසානය දක්වා පවත්වා ගත යුතු ය. තෝරා ගත් ස්කේලය (Scale) වෙනස්කර ගායනය/ වාදනය කිරීම නොකළ යුතු ය.
- කාලය - ගීතයට අදාළ කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 08කි.

A.2.5 ඒකල වාදනය - (කනිෂ්ඨ) ගැහැණු/ රාගධාරී/ වයලින්/ නියමිත රාගය - බිලාවල්
A.2.6 ඒකල වාදනය - (කනිෂ්ඨ) පිරිමි/ රාගධාරී/ වයලින්/ නියමිත රාගය - බිලාවල්
A.2.7 ඒකල වාදනය - (කනිෂ්ඨ) ගැහැණු/ රාගධාරී/ බටනලා/ නියමිත රාගය - යමන්
A.2.8 ඒකල වාදනය - (කනිෂ්ඨ) පිරිමි/ රාගධාරී/ බටනලා/ නියමිත රාගය - යමන්

ඉහත A.2.5 සිට A.2.8 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- මධ්‍යලය ඛ්‍යාල් හෝ ගත් වාදනයක් විය යුතු ය.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව හෝ ජංගම දුරකථන යෙදවුම් (apps) මගින් තාම්පුරා හඬ භාවිතා කළ හැක. එහි දී චක්‍රලේඛයෙහි 6.2 වගන්තියට අනුකූල විය යුතු ය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය වාදන අංගවලින් පෝෂිත විය යුතු ය.
- නිවැරදි ඉරියව් සහ හස්ත සාධනය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 05කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 03කි.

A.2.9 ඒකල වාදනය - (කනිෂ්ඨ) ගැහැණු/ තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්
A.2.10 ඒකල වාදනය - (කනිෂ්ඨ) පිරිමි/ තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්

**ඉහත A.2.9 සහ A.2.10 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- මධ්‍යලය වාදනයක් විය යුතු ය.
- වයනු ලබන ලෙහෙරාවකට අනුගත විය යුතු ය.
- ශාස්ත්‍රීය තබ්ලා වාදන අංග හා ප්‍රබන්ධ, සාම්ප්‍රදායික පිළිවෙලින් ඉදිරිපත් කළ යුතු ය.
- නිවැරදි වාදන ඉරියව් සහ නාද නිෂ්පත්තිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 05කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 02කි.

A.2.11 ඒකල වාදනය - (කනිෂ්ඨ) ගැහැණු/හාර්මෝනියම්/ගී අනුවාදනය - 'නොබලන් කුමරිය' (B flat major) - ටී. එම් ජයරත්න
A.2.12 ඒකල වාදනය - (කනිෂ්ඨ) පිරිමි/හාර්මෝනියම්/ගී අනුවාදනය - 'පින්න මලේ සුද' (E minor) - එඩ්වඩ් ජයකොඩි

**ඉහත A.2.11 සහ A.2.12 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- ගීතය ඉදිරියේ දී ඇති ස්කේලයම (Scale) පාදක කර ගත යුතු ය.
- තෝරා ගත් ගීතයෙහි පෙර වාදන, අතුරු වාදන සහ ගීතයේ තනුව වෙනස් නොවන පරිදි (මුල් නාද මාලාවට හානි නොවන පරිදි) ඉදිරිපත් කළ යුතු ය.
- සහාය තාල වාදනය සඳහා මුල් ගීතයෙහි යොදාගෙන ඇති තාල වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව හෝ යොදා ගත හැක.
- අවශ්‍ය නම් තාල වාද්‍ය භාණ්ඩය සමඟ බොක්ස් ගිටාරය ද සහාය වාදනයට යොදා ගත හැක.
- කාලය ගීතයට අදාළ කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 02කි.

## 02. ජ්‍යෙෂ්ඨ - 1 කොටස (10 - 11 ශ්‍රේණිවල සිසුන් සඳහා)

B.1.13 ඒකල ගායනය - (ජ්‍යෙෂ්ඨ-1) ගැහැණු/රාගධාරී/ නියමිත රාගය - යමන්
B.1.14 ඒකල ගායනය - (ජ්‍යෙෂ්ඨ-1) පිරිමි/රාගධාරී/ නියමිත රාගය - භෛරවී

**ඉහත B.1.13 සහ B.1.14 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- හින්දි බසින් රචිත ඛ්‍යාල් ශෛලියේ මධ්‍යලය ගීතයක් විය යුතු ය.
- සාම්ප්‍රදායික ශාස්ත්‍රීය ඒකල ගායන අංගවලින් පෝෂිත විය යුතු ය.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කළ නොහැක.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව හෝ ජංගම දුරකථන යෙදවුම් (apps) මගින් තාම්පුරා හඬ භාවිත කළ හැක. එහි දී චක්‍රලේඛයෙහි 6.2 වගන්තියට අනුකූල විය යුතු ය.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 06කි.
- තබ්ලාවෙන් සහාය වාදනයට සහභාගී විය යුත්තේ පාසල් සිසු/ සිසුවියන් පමණි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 04කි.

B.1.14a ඒකල ගායනය - (ජ්‍යෙෂ්ඨ-1) ගැහැණු/ ජන ගී (රබන් ගී)
B.1.14b ඒකල ගායනය - (ජ්‍යෙෂ්ඨ-1) පිරිමි/ ජන ගී (බඹර ගී)

**ඉහත B.1.14a සහ B.1.14b ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- අදාළ ජන ගී වර්ගයෙන් එක් ගීතයක් පමණක් ගායනය කළ යුතු ය.
- සාම්ප්‍රදායික නාද මාලාවම විය යුතු ය.
- රබන් ගී ගායනයට ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා හාර්මෝනියම් සංගීත භාණ්ඩයත්, තාලය පවත්වා ගැනීම සඳහා ජන සංගීත සම්ප්‍රදායට **උචිත තාල වාද්‍ය භාණ්ඩයක් ද** යොදාගත යුතු ය.
- බඹර ගී ගායනයට ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා හාර්මෝනියම් සංගීත භාණ්ඩය පමණක් භාවිත කළ යුතු ය.
- ගායනයට බාධා නොවන සේ උචිත පරිදි ප්‍රකාශනාත්මක අංග චලන යොදාගත හැක.
- කාලය - ගීතය ගායනය සඳහා ගතවන කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 02කි.

B.2.15 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) ගැහැණු/රාගධාරී/වයලින්/නියමිත රාගය - කාෆි
B.2.16 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) පිරිමි/රාගධාරී/වයලින්/නියමිත රාගය - කාෆි
B.2.17 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) ගැහැණු/රාගධාරී/බටනලා/නියමිත රාගය - භූපාලි
B.2.18 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) පිරිමි/රාගධාරී/බටනලා/නියමිත රාගය - භූපාලි
B.2.19 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) ගැහැණු/රාගධාරී/ගිටාර්/නියමිත රාගය - යමන්
B.2.20 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) පිරිමි/රාගධාරී/ගිටාර්/නියමිත රාගය - යමන්

**ඉහත B.2.15 සිට B.2.20 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- මධ්‍යලය බ්‍යාල් හෝ ගත් වාදනයක් විය යුතු ය.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව හෝ ජංගම දුරකථන යෙදවුම් (apps) මගින් තාම්පුරා හඬ භාවිත කළ හැක. එහි දී චක්‍රලේඛයෙහි 6.2 වගන්තියට අනුකූල විය යුතු ය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය වාදන අංගවලින් පෝෂිත විය යුතු ය.
- නිවැරදි ඉරියව් සහ හස්ත සාධනය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 06කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 03කි.

B.2.21 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) ගැහැණු/තබ්ලා/නියමිත තාලය - රූපක්
B.2.22 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) පිරිමි/තබ්ලා/නියමිත තාලය - ඒක්තාල්

**ඉහත B.2.21 සහ B.2.22 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- මධ්‍යලය වාදනයක් විය යුතු ය.
- වයනු ලබන ලෙහෙරාවකට අනුගත විය යුතු ය.
- ශාස්ත්‍රීය තබ්ලා වාදන අංග හා ප්‍රබන්ධ, සාම්ප්‍රදායික පිළිවෙලින් ඉදිරිපත් කළ යුතු ය.
- නිවැරදි වාදන ඉරියව් සහ නාද නිෂ්පත්තිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 05කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 02කි.

B.2.23 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) ගැහැණු/හාර්මෝනියම්/ගී අනුවාදනය - "මනමාල ගිරව්" (C minor) - සෝමතිලක ජයමහ

B.2.24 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) පිරිමි/හාර්මෝනියම්/ගී අනුවාදනය - "මුව මුක්තා ලතා" (C minor) – එඩ්වඩ් ජයකොඩි

**ඉහත B.2.23 සහ B.2.24 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- ගීතය ඉදිරියේ දී ඇති ස්කේලයම (Scale) පාදක කර ගත යුතු ය.
- තෝරා ගත් ගීතයෙහි පෙර වාදන, අතුරු වාදන සහ ගීතයේ තනුව වෙනස් නොවන පරිදි (මුල් නාද මාලාවට හානි නොවන පරිදි) ඉදිරිපත් කළ යුතු ය.
- සහාය තාල වාදනය සඳහා මුල් ගීතයෙහි යොදාගෙන ඇති තාල වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව / ඩොල්කිය යොදා ගත හැක.
- අවශ්‍ය නම් තාල වාද්‍ය භාණ්ඩය සමඟ බොක්ස් ගිටාරය ද සහාය වාදනයට යොදා ගත හැක.
- කාලය ගීතයට අදාළ කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 02කි.
- විනිශ්චය ලබා දීමේ දී ප්‍රධාන තරගකරුගේ වාදන කුසලතාව පිළිබඳව සුවිශේෂී අවධානය යොමු කෙරේ.

## 03. ජ්‍යෝෂ්ඨ - 2 කොටස (12 - 13 ශ්‍රේණිවල සිසුන් සඳහා)

C.1.25 ඒකල ගායනය - (ජ්‍යෝෂ්ඨ-2) ගැහැණු/රාගධාරී/ නියමිත රාගය - බාගේශ්‍රී

C.1.26 ඒකල ගායනය - (ජ්‍යෝෂ්ඨ-2) පිරිමි/රාගධාරී/ නියමිත රාගය -ජයජයවන්ති

**ඉහත C.1.25 සහ C.1.26 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- හින්දි බසින් රචිත විලම්භ සහ මධ්‍යලය ඛ්‍යාල් ගී දෙවර්ගයම ඉදිරිපත් කළ යුතු ය.
- සාම්ප්‍රදායික ශාස්ත්‍රීය ඒකල ගායන අංගවලින් පෝෂිත විය යුතු ය.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කළ නොහැක.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව හෝ ජංගම දුරකථන යෙදවුම් (apps) මගින් තාම්පුරා හඬ භාවිතා කළ හැක. එහි දී චක්‍රලේඛයෙහි 6.2 වගන්තියට අනුකූල විය යුතු ය.
- කාලය: අවම විනාඩි 08කි. උපරිම විනාඩි 10කි.
- තබ්ලාවෙන් සහාය වාදනයට සහභාගී විය යුත්තේ පාසල් සිසු/ සිසුවියන් පමණි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 04කි.

C.1.27 ඒකල ගායනය - (ජ්‍යෝෂ්ඨ-2) ගැහැණු/ ජන ගී (අනාසාතාත්මක වැළපුම් ගී)

C.1.28 ඒකල ගායනය - (ජ්‍යෝෂ්ඨ-2) පිරිමි/ ජන ගී (පතල්)

**ඉහත C.1.27 සහ C.1.28 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- අනාසාතාත්මක එක් ගීතයක් පමණක් ගායනය කළ යුතු ය.
- සාම්ප්‍රදායික නාද මාලාවම විය යුතු ය.
- ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා හාර්මෝනියම් සංගීත භාණ්ඩය පමණක් යොදා ගත යුතු ය.
- ගායනයට බාධා නොවන සේ උචිත පරිදි ප්‍රකාශනාත්මක අංග චලන යොදා ගත හැක..
- කාලය: ගීතය ගායනය සඳහා ගතවන කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 01කි.

C.2.29 ඒකල වාදනය - (ජ්‍යෝෂ්ඨ-2) ගැහැණු/රාගධාරී/වයලින්/නියමිත රාගය - ආසාවරී

C.2.30 ඒකල වාදනය - (ජ්‍යෝෂ්ඨ-2) පිරිමි/රාගධාරී/වයලින්/නියමිත රාගය - ආසාවරී

C.2.31 ඒකල වාදනය - (ජ්‍යෝෂ්ඨ-2) ගැහැණු/රාගධාරී/බටනලා/නියමිත රාගය - දේස්

C.2.32 ඒකල වාදනය - (ජ්‍යෝෂ්ඨ-2) පිරිමි/රාගධාරී/බටනලා/නියමිත රාගය - දේස්

**ඉහත C.2.29 සිට C.2.32 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- ඛ්‍යාල් හෝ ගත් ශෛලීය විලම්භලය සහ මධ්‍යලය හෝ ධ්‍රැතලය වාදනයක් විය යුතු ය.
- සාම්ප්‍රදායික ශාස්ත්‍රීය ඒකල වාදන අංගවලින් පෝෂිත විය යුතු ය.
- නිවැරදි ඉරියව් සහ හස්ත සාධන පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව හෝ ජංගම දුරකථන යෙදවුම් (apps) මගින් තාම්පුරා හඬ භාවිතා කළ හැක. එහි දී චක්‍රලේඛයෙහි 6.2 වගන්තියට අනුකූල විය යුතු ය.
- කාලය: අවම විනාඩි 08කි. උපරිම විනාඩි 10කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 03කි.

C.2.33 ඒකල වාදනය - (ජ්‍යෙෂ්ඨ-2) ගැහැණු/තබ්ලා/නියමිත තාලය - ත්‍රිතාල්

C.2.34 ඒකල වාදනය - (ජ්‍යෙෂ්ඨ-2) පිරිමි/තබ්ලා/නියමිත තාලය - ත්‍රිතාල්

<u>ඉහත C.2.33 සහ C.2.34 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි</u>

- විලම්භලය සහ මධ්‍යලය වාදනයක් විය යුතු ය.
- වයනු ලබන ලෙහෙරාවට අනුගත විය යුතු ය.
- ශාස්ත්‍රීය තබ්ලා වාදන අංග හා ප්‍රබන්ධ සාම්ප්‍රදායික ලෙස ඉදිරිපත් කළ යුතු ය.
- නිවැරදි වාදන ඉරියව් සහ නාද නිෂ්පත්තිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 06කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 02කි.

C.2.35 ඒකල වාදනය - (ජ්‍යෙෂ්ඨ-2) ගැහැණු/හාර්මෝනියම්/ගී අනුවාදනය - "මනුසතා ලෝකේ ඉපදී" (F minor) - මොහිදීන් බෙග්

C.2.36 ඒකල වාදනය - (ජ්‍යෙෂ්ඨ-2) පිරිමි/හාර්මෝනියම්/ගී අනුවාදනය - "පුංචි දඟකාරියේ" (D major) – සේනානායක වේරලියද්ද

<u>ඉහත C.2.35 සහ C.2.36 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි</u>

- ගීතය ඉදිරියේ දී ඇති ස්කේලයම (Scale) පාදක කර ගත යුතු ය.
- දී ඇති ගීතයෙහි පෙර වාදන, අතුරු වාදන සහ ගීතයේ තනුව වෙනස් නොවන පරිදි (මුල් නාද මාලාවට හානි නොවන පරිදි) ඉදිරිපත් කළ යුතු ය.
- සහාය තාල වාදනය සඳහා මුල් ගීතයෙහි යොදාගෙන ඇති තාල වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව / ඩොල්කිය හෝ ඒ දෙකෙහි සංකලනය කර හෝ යොදා ගත හැක.
- අවශ්‍ය නම් තාල වාද්‍ය භාණ්ඩය සමඟ බොක්ස් ගිටාරය ද සහාය වාදනයට යොදා ගත හැක.
- කාලය ගීතයට අදාළ කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 02කි. (විනිශ්චය ලබා දීමේ දී ප්‍රධාන තරගකරුගේ වාදන කුසලතාව පිළිබඳ සුවිශේෂී අවධානය යොමු කෙරේ).

## <u>4. විවෘත කොටස (6 - 13 ශ්‍රේණිවල සිසුන් සඳහා)</u>

D.1.37a සමූහ ගායනය - (ගැහැණු) හින්දි චිත්‍රපට ගීත - "Naina Barse Rimajhim Rimajhim" (චිත්‍රපටය - Who Kaun Thi) - Latha Mangeshkar

D.1.37b සමූහ ගායනය - (පිරිමි) සිංහල චිත්‍රපට ගීත - "ඈත ගව් ගණන් දුරින්" (චිත්‍රපටය - ගැටවරයෝ) - නාරද දිසාසේකර සහ පිරිස

D.1.37c සමූහ ගායනය - (මිශ්‍ර) දෙමළ චිත්‍රපට ගීත - "Aasai Patta Ellathayum" (චිත්‍රපටය - Viyabari-deva) - Hariharan සහ Vaishali

<u>ඉහත D.1.37a, D.1.37b, සහ D.1.37c යන ශීර්ෂයට අදාළ කොන්දේසි</u>

- අදාළ ගීතය පෙර වාදන, අතුරු වාදන, වෙනත් ශිල්පාංග සමග මුල් නාද මාලාවට හානි නොවන පරිදි සමූහ ගායන/වාදන අංගවලින් විචිත්‍ර කළ හැක.
- ගායනයට බාධා නොවන සේ උචිත පරිදි ප්‍රකාශනාත්මක චලන යොදා විචිත්‍රවත් කළ හැක.
- කාලය නියමිත ගීතයට ගතවන කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - වාදක මඩුල්ල හැර අවම 12කි. වාදක මඩුල්ල සමග උපරිම 20කි.
- එක් පාසලකට මින් එක් ශීර්ෂයකට පමණක් ඉදිරිපත් විය හැකි ය.

D.1.38a සමූහ ගායනය - (විවෘත) / ගැහැණු / ස්වතන්ත්‍ර නිර්මාණ/ කෙළි ගී
D.1.38b සමූහ ගායනය - (විවෘත) / පිරිමි / ස්වතන්ත්‍ර නිර්මාණ/ දැල් ගී
D.1.38c සමූහ ගායනය - (විවෘත) / මිශ්‍ර / ස්වතන්ත්‍ර නිර්මාණ/ කෙත හා බැඳි ගී

<u>ඉහත D.1.38a, D.1.38b, සහ D.1.38c යන **ශීර්ෂයට අදාළ කොන්දේසි**</u>

- ඉහත ඒ ඒ තරග ශීර්ෂයන් සමග දී ඇති ජන ගී සම්ප්‍රදායට අයත් නාද මාලා ඇසුරින් සිදු කරන ලද නව නිර්මාණයක් විය යුතු ය.
- පද මාලාව නිර්මාණයේ දී 2.15හි සඳහන් උපදෙස් පිළිපැදිය යුතු ය.
- ගායනයට බාධා නොවන සේ උචිත පරිදි ප්‍රකාශනාත්මක අංග චලන යොදා ගත හැක.
- ගායනයට හානි නොවන සේ උචිත පරිදි සමූහ ගායන අංග යොදා විචිත්‍රවත් කළ හැක.
- විද්‍යුත් සංගීත භාණ්ඩ, ආදේශ භාණ්ඩ සහ පියානෝව භාවිත නොකළ යුතු ය.
- අවශ්‍ය නම් දඬුබෙරය යොදා ගත හැකි ය.
- කාලය: අවම විනාඩි 03කි. උපරිම විනාඩි 04කි.
- සංඛ්‍යාව - වාදක මඩුල්ල හැර අවම 12කි. වාදක මඩුල්ල සමග උපරිම සංඛ්‍යාව 20කි.
- එක් පාසලකට මින් එක් ශීර්ෂයකට පමණක් ඉදිරිපත් විය හැකි ය.

D.2.39a සමූහ වාදනය - (විවෘත) / ගැහැණු / "පිපි කුසුම වදුල සිඹිමින්" ('සිරි පැරකුම්' චිත්‍රපටය)
D.2.39b සමූහ වාදනය - (විවෘත) / පිරිමි / "කවුරු ද කවුරු ද දැන් ලොක්කෝ" ('හදයා' චිත්‍රපටය)
D.2.39c සමූහ වාදනය - (විවෘත) / මිශ්‍ර / "කොහේද කොහේද අපේ ලොවක්" - ('මඩොල් දූව' චිත්‍රපටය)

<u>ඉහත D.1.39a, D.1.39b, සහ D.1.39c යන **ශීර්ෂයට අදාළ කොන්දේසි**</u>

- වාදකයෙකුට භාණ්ඩ කිහිපයක් වුවද වාදනය කළ හැකි අතර කටහඬ යොදා ගත නොහැක.
- ආදේශ භාණ්ඩ, විද්‍යුත් භාණ්ඩ සහ පියානෝව යොදා ගත නොහැක.
- අවශ්‍ය නම් දඬුබෙරය යොදා ගත හැක.
- මෙහෙයවන්නා අදාළ පාසලේ ගුරුභවතෙකු නම්, ඔහු හෝ ඇය තරග කණ්ඩායමේ සාමාජික සංඛ්‍යාවට අයත් වන අතර, ඔහුට හෝ ඇයට වාදනයෙන් සහාය විය නොහැක.
- කාලය නියමිත ගීතයට ගතවන කාලය ලෙස සලකන්න.
- සංඛ්‍යාව - වාදක මණ්ඩලය (මෙහෙයවන්නා ද ඇතුළුව) අවම 12කි. උපරිම සංඛ්‍යාව 20කි.
- එක් පාසලකට මින් එක් ශීර්ෂයකට පමණක් ඉදිරිපත් විය හැකි ය.

D.3.40 සමූහ - (විවෘත) / නාට්‍ය ජවනිකා - "දිව්‍ය ලෝකේ ළගයි ජේන මානේ" නාට්‍යය - දෙව් ලොව යනකං - ආනන්ද එස්. විජයසිරි.

<u>ඉහත D.3.40 **ශීර්ෂයට අදාළ කොන්දේසි**</u>

- කාලය - දී ඇති ප්‍රාසාංගික කොටසට ගතවන කාලය වේ.
- දෙබස්, ගී පද හා තනු වෙනස් කිරීම සිදු නොකළ යුතු අතර, නාට්‍ය ජවනිකාව එපරිද්දෙන්ම ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ.
- වේදිකා පසුතල නිර්මාණ හා උපකරණ භාවිත නොකළ යුතු ය. එනමුත් ජවනිකාවට අදාළව නළු නිළියන් හා ගායක කණ්ඩායමට අදාළ පරිදි, රංග භාණ්ඩ යොදාගත හැක.
- පළාත් සහ අවසාන තරග අවස්ථාවල දී වේදිකාවේ සිටින තරගකරුවන් රංග වස්ත්‍රවලින් සැරසී ඉදිරිපත් විය යුතු ය.
- ගැහැණු, පිරිමි, මිශ්‍ර වශයෙන් වර්ග නො වේ.
- සහභාගී විය හැකි සංඛ්‍යාව- ගායනය ඉදිරිපත් කරන චරිත දෙක ඇතුළුව රංගනයේ යෙදෙන සංඛ්‍යාව 4කි. වාදක මණ්ඩලය උපරිම 08 කි.

## 05. විශේෂ කොටස (10 - 13 ශ්‍රේණිවල සිසුන් සඳහා)

E.2.41 ඒකල වාදනය - (විශේෂ) - ගී අනුවාදන/ අළුවෙන් වැයෙන භාණ්ඩ කාණ්ඩය (bowing instruments) වයලින්, එස්රාජ්, දිල්රුබා, සාරංගි

E.2.42 ඒකල වාදනය - (විශේෂ) - ගී අනුවාදන/ මිශ්‍රාබ්, pick වැනි උපකරණ භාවිතයෙන් වැයෙන භාණ්ඩ කාණ්ඩය (plucking instruments) සිතාර්, සරෝද්, මෝහන් වීණා, බොක්ස් ගිටාර්, සන්තූර්, බැංජො මැන්ඩලින්, ඉංග්ලිෂ් මැන්ඩලින්

E.2.43 ඒකල වාදනය- (විශේෂ) - ගී අනුවාදන/ පිඹීමෙන් වැයෙන භාණ්ඩ කාණ්ඩය (blowing instruments) බටනලා, සැක්සෆෝන්, ෂෙහෙනායි, ක්ලැරිනට්

<u>ඉහත E.2.41 සිට E.2.43 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි</u>

- පහත එක් ගීතයක් පමණක් තෝරාගත යුතු ය.

| | |
|---|---|
| පායා ඇයි හිනැහෙන්නේ | කවිය ඔබ |
| අඳුර බිඳින්නට | සුළං කපොල්ලේ |
| වළා තීරයෙන් එහා | සරා සඳේ |
| සුදු මුදු රළ පෙළ | මගේ සඳ ඔබ |
| අතීතය සිහිනයක් පමණයි | ඔබෙ දෙතොල් පෙති ලිහී |
| මා වවුලන් රෑ පුරාම | සුනිල්වන් නුවන් යුග |

- විනිශ්චයේ දී ප්‍රධාන තරගකරුගේ වාදන කුසලතාව පමණක් ඇගයීමට ලක් කෙරේ.
- තරගය පවත්වනු ලබන පාසලේ පරිපථයෙන් විදුලිය සම්පාදනය නොකෙරේ.
- සහාය වාදනය සඳහා විදුලි ඕගනය භාවිත කළ හැක.
- කාලය ගීතයට නියමිත කාලය ලෙස සලකන්න.
- ඉහත දී ඇති සංගීත භාණ්ඩ වර්ගීකරණ කාණ්ඩවලට අයත් එක් භාණ්ඩයක් පමණක් තෝරා ගෙන ඉදිරිපත් කළ යුතු ය. (භාණ්ඩ අනුව වර්ගීකරණය සිදු නොවේ.)
- ගැහැණු - පිරිමි වශයෙන් වර්ග නොකෙරේ.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 05කි.

# 6 – 13 ශිෂ්‍ය සංඛ්‍යාව 301ත් 1000ත් අතර පාසල් - (A.1.44 සිට E.2.97 දක්වා)

## 01. කනිෂ්ඨ කොටස (6 - 9 ශ්‍රේණිවල සිසුන් සඳහා)

A.1.44 ඒකල ගායනය - (කනිෂ්ඨ) ගැහැණු/රාගධාරී/ නියමිත රාගය - කාෆි
A.1.45 ඒකල ගායනය - (කනිෂ්ඨ) පිරිමි/රාගධාරී/ නියමිත රාගය - බිලාවල්

<u>ඉහත A.1.44 සහ A.1.45 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි</u>

- හින්දි බසින් රචිත ඛ්‍යාල් ශෛලියේ මධ්‍යාලය ගීතයක් විය යුතු ය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය ගායනා අංගවලින් පෝෂිත විය යුතු ය.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කළ නොහැක.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව හෝ ජංගම දුරකථන යෙදවුම් (apps) මගින් තාම්පුරා හඬ භාවිතා කළ හැක. එහි දී චක්‍රලේඛයෙහි 6.2 වගන්තියට අනුකූල විය යුතු ය.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 04කි.

A.1.46 ඒකල ගායනය - (කනිෂ්ඨ) ගැහැණු/ සරල ගී /"කුස පිරී නැති වළඳ අබියස" - සශිකා නිසංසලා
A.1.47 ඒකල ගායනය - (කනිෂ්ඨ) පිරිමි/ සරල ගී/ "සොයා පිළිසරණක්" - සුනිල් එදිරිසිංහ

**ඉහත A.1.46 සහ A.1.47 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- තෝරා ගත් ගීතයෙහි පෙර වාදන, අතුරු වාදන සහ ගීතයේ තනුව වෙනස් නොවන පරිදි (මුල් නාද මාලාවට හානි නොවන පරිදි) ඉදිරිපත් කළ යුතු ය.
- ගීතය ගායනය/ වාදනය සඳහා තෝරා ගන්නා ස්කේලයම (Scale) ගීතයෙහි ආරම්භයේ සිට අවසානය දක්වා පවත්වා ගත යුතු ය. තෝරා ගත් ස්කේලය (Scale) වෙනස්කර ගායනය/ වාදනය කිරීම නොකළ යුතු ය.
- කාලය - ගීතයට අදාළ කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 08කි.

A.2.48 ඒකල වාදනය - (කනිෂ්ඨ) ගැහැණු/ රාගධාරී/ වයලින්/ නියමිත රාගය - බිලාවල්
A.2.49 ඒකල වාදනය - (කනිෂ්ඨ) පිරිමි/ රාගධාරී/ වයලින්/ නියමිත රාගය - බිලාවල්
A.2.50 ඒකල වාදනය - (කනිෂ්ඨ) ගැහැණු/ රාගධාරී/ බටනලා/ නියමිත රාගය - යමන්
A.2.51 ඒකල වාදනය - (කනිෂ්ඨ) පිරිමි/ රාගධාරී/ බටනලා/ නියමිත රාගය - යමන්

**ඉහත A.2.48 සහ A.2.51 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- මධ්‍යලය ඛ්‍යාල් හෝ ගත් වාදනයක් විය යුතු ය.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව හෝ ජංගම දුරකථන යෙදවුම් (apps) මගින් තාම්පුරා හඬ භාවිතා කළ හැක. එහි දී චක්‍රලේඛයෙහි 6.2 වගන්තියට අනුකූල විය යුතු ය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය වාදන අංගවලින් පෝෂිත විය යුතු ය.
- නිවැරදි ඉරියව් සහ හස්ත සාධනය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 05කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 03කි.

A.2.52 ඒකල වාදනය - (කනිෂ්ඨ) ගැහැණු/ තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්
A.2.53 ඒකල වාදනය - (කනිෂ්ඨ) පිරිමි/ තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්

**ඉහත A.2.52 සහ A.2.53 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- මධ්‍යලය වාදනයක් විය යුතු ය.
- වයනු ලබන ලෙහෙරාවකට අනුගත විය යුතු ය.
- ශාස්ත්‍රීය තබ්ලා වාදන අංග හා ප්‍රබන්ධ, සාම්ප්‍රදායික පිළිවෙලින් ඉදිරිපත් කළ යුතු ය.
- නිවැරදි වාදන ඉරියව් සහ නාද නිෂ්පත්තිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 05කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 02කි.

A.2.54 ඒකල වාදනය - (කනිෂ්ඨ) ගැහැණු/ හාර්මෝනියම්/ ගී අනුවාදනය - "හරි හම්බ කරපු දේවල්" (E flat major) - එඩ්වඩ් ජයකොඩි

A.2.55 ඒකල වාදනය - (කනිෂ්ඨ) පිරිමි/ හාර්මෝනියම්/ ගී අනුවාදනය - "පොඩි කුමාරිහාමි මං" (C major) – ස්වර්ණලතා කවීශ්වර

**ඉහත A.2.54 සහ A.2.55 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- ගීතය ඉදිරියේ දී ඇති ස්කේලයම (Scale) පාදක කර ගත යුතු ය.
- දී ඇති ගීතයෙහි පෙර වාදන, අතුරු වාදන සහ ගීතයේ තනුව වෙනස් නොවන පරිදි (මුල් නාද මාලාවට හානි නොවන පරිදි) ඉදිරිපත් කළ යුතු ය.
- සහාය තාල වාදනය සඳහා මුල් ගීතයෙහි යොදාගෙන ඇති තාල වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව හෝ යොදා ගත හැක.
- අවශ්‍ය නම් තාල වාද්‍ය භාණ්ඩය සමඟ බොක්ස් ගිටාරය ද සහාය වාදනයට යොදා ගත හැක.
- කාලය ගීතයට අදාළ කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර උපරිම සංඛ්‍යාව 02කි.

## 02. ජෝෂ්ඨ - 1 කොටස (10 – 11 ශ්‍රේණිවල සිසුන් සඳහා)

B.1.56 ඒකල ගායනය - (ජෝෂ්ඨ-1) ගැහැණු/ රාගධාරී/ නියමිත රාගය - යමන්
B.1.57 ඒකල ගායනය - (ජෝෂ්ඨ-1) පිරිමි/ රාගධාරී/ නියමිත රාගය - භෛරවී

**ඉහත B.1.56 සහ B.1.57 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- හින්දි බසින් රචිත ඛ්‍යාල් ශෛලියේ මධ්‍යලය ගීතයක් විය යුතු ය.
- සාම්ප්‍රදායික ශාස්ත්‍රීය ඒකල ගායන අංගවලින් පෝෂිත විය යුතු ය.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කළ නොහැක.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව හෝ ජංගම දූරකථන යෙදවුම් (apps) මගින් තාම්පුරා හඬ භාවිතා කළ හැක. එහි දී චක්‍රලේඛයෙහි 6.2 වගන්තියට අනුකූල විය යුතු ය.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 06කි.
- තබ්ලාවෙන් සහාය වාදනයට සහභාගී විය යුත්තේ පාසල් සිසු/ සිසුවියන් පමණි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 04කි.

B.1.58 ඒකල ගායනය - (ජෝෂ්ඨ-1) ගැහැණු/ ජන ගී (රබන් ගී)
B.1.59 ඒකල ගායනය - (ජෝෂ්ඨ-1) පිරිමි/ ජන ගී (බඹර ගී)

**ඉහත B.1.58 සහ B.1.59 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- අදාළ ජන ගී වර්ගයෙන් එක් ගීතයක් පමණක් ගායනය කළ යුතු ය.
- සාම්ප්‍රදායික නාද මාලාවම විය යුතු ය.
- රබන් ගී ගායනයට ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා හාර්මෝනියම් සංගීත භාණ්ඩයත්, තාලය පවත්වා ගැනීම සඳහා ජන සංගීත සම්ප්‍රදායට **උචිත තාල වාද්‍ය භාණ්ඩයක් ද** යොදාගත යුතු ය.
- බඹර ගී ගායනයට ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා හාර්මෝනියම් සංගීත භාණ්ඩය පමණක් භාවිත කළ යුතු ය.
- ගායනයට බාධා නොවන සේ උචිත පරිදි ප්‍රකාශනාත්මක අංග චලන යොදාගත හැක.
- කාලය - ගීතය ගායනය සඳහා ගතවන කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 02කි.

B.2.60 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) ගැහැණු/රාගධාරී/වයලීන්/නියමිත රාගය - කාෆි
B.2.61 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) පිරිමි/රාගධාරී/වයලීන්/නියමිත රාගය - කාෆි
B.2.62 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) ගැහැණු/රාගධාරී/බටනලා/නියමිත රාගය - භූපාලි
B.2.63 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) පිරිමි/රාගධාරී/බටනලා/නියමිත රාගය - භූපාලි
B.2.64 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) ගැහැණු/රාගධාරී/ගිටාර්/නියමිත රාගය - යමන්
B.2.65 ඒකල වාදනය - (ජෝෂ්ඨ-1) පිරිමි/රාගධාරී/ගිටාර්/නියමිත රාගය - යමන්

**ඉහත B.2.60 සහ B.2.65 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- මධ්‍යලය ඛ්‍යාල් හෝ ගත් වාදනයක් විය යුතු ය.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව හෝ ජංගම දූරකථන යෙදවුම් (apps) මගින් තාම්පුරා හඬ භාවිතා කළ හැක. එහි දී චක්‍රලේඛයෙහි 6.2 වගන්තියට අනුකූල විය යුතු ය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය වාදන අංගවලින් පෝෂිත විය යුතු ය.
- නිවැරදි ඉරියව් සහ හස්ත සාධනය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 06කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 03කි.

B.2.66 ඒකල වාදනය - (ජ්‍යෝෂ්ඨ-1) ගැහැණු/තබ්ලා/නියමිත තාලය - රූපක්
B.2.67 ඒකල වාදනය - (ජ්‍යෝෂ්ඨ-1) පිරිමි/තබ්ලා/නියමිත තාලය - ඒක්තාල්

**ඉහත B.2.66 සහ B.2.67 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- මධ්‍යලය වාදනයක් විය යුතු ය.
- වයනු ලබන ලෙහෙරාවකට අනුගත විය යුතු ය.
- ශාස්ත්‍රීය තබ්ලා වාදන අංග හා ප්‍රබන්ධ, සාම්ප්‍රදායික පිළිවෙලින් ඉදිරිපත් කළ යුතු ය.
- නිවැරදි වාදන ඉරියව් සහ නාද නිෂ්පත්තිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 05කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 02කි.

B.2.68 ඒකල වාදනය - (ජ්‍යෝෂ්ඨ-1) ගැහැණු/හාර්මෝනියම්/ගී අනුවාදනය - "ඔරුවක පාවෙන" (E flat major) - මිල්ටන් මල්ලවආරච්චි

B.2.69 ඒකල වාදනය - (ජ්‍යෝෂ්ඨ-1) පිරිමි/හාර්මෝනියම්/ගී අනුවාදනය - "ගමේ ගොඩේ සිදාදියේ" (E minor / ආරම්භය E major) - මොහිදීන් බෙග්

**ඉහත B.2.68 සහ B.2.69 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- ගීතය ඉදිරියේ දී ඇති ස්කේලයම (Scale) පාදක කර ගත යුතු ය.
- තෝරා ගත් ගීතයෙහි පෙර වාදන, අතුරු වාදන සහ ගීතයේ තනුව වෙනස් නොවන පරිදි (මුල් නාද මාලාවට හානි නොවන පරිදි) ඉදිරිපත් කළ යුතු ය.
- සහාය තාල වාදනය සඳහා මුල් ගීතයෙහි යොදාගෙන ඇති තාල වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව හෝ යොදා ගත හැක.
- අවශ්‍ය නම් තාල වාද්‍ය භාණ්ඩය සමඟ බොක්ස් ගිටාරය ද සහාය වාදනයට යොදා ගත හැක.
- කාලය ගීතයට අදාළ කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර උපරිම සංඛ්‍යාව 02කි.

## 03. ජ්‍යෝෂ්ඨ - 2 කොටස (12 – 13 ශ්‍රේණිවල සිසුන් සඳහා)

C.1.70 ඒකල ගායනය - (ජ්‍යෝෂ්ඨ-2) ගැහැණු/රාගධාරී/ නියමිත රාගය - බාගේශ්‍රී
C.1.71 ඒකල ගායනය - (ජ්‍යෝෂ්ඨ-2) පිරිමි/රාගධාරී/ නියමිත රාගය - ජයජයවන්ති

**ඉහත C.1.70 සහ C.1.71 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- හින්දි බසින් රචිත විලම්භ සහ මධ්‍යලය ඛ්‍යාල් ගී දෙවර්ගයම ඉදිරිපත් කළ යුතු ය.
- සාම්ප්‍රදායික ශාස්ත්‍රීය ඒකල ගායන අංගවලින් පෝෂිත විය යුතු ය.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කළ නොහැක.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව හෝ ජංගම දුරකථන යෙදවුම් (apps) මගින් තාම්පුරා හඬ භාවිතා කළ හැක. එහි දී චක්‍රලේඛයෙහි 6.2 වගන්තියට අනුකූල විය යුතු ය.
- කාලය: අවම විනාඩි 08කි. උපරිම විනාඩි 10කි.
- තබ්ලාවෙන් සහාය වාදනයට සහභාගී විය යුත්තේ පාසල් සිසු/ සිසුවියන් පමණි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 04කි.

C.1.72 ඒකල ගායනය - (ජ්‍යෝෂ්ඨ-2) ගැහැණු/ ජන ගී (නෙළුම් ඕසේ)

C.1.73 ඒකල ගායනය - (ජ්‍යෝෂ්ඨ-2) පිරිමි/ ජන ගී (පාරු ගී)

**ඉහත C.1.72 සහ C.1.73 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

